Department Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - ආර්ථික විද්‍යාව

සතිය - 18

ශ්‍රේණිය - 13

සකස් කළේ-රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලය

නිපුණතාව 09 - විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 9.3 - විදේශ වෙළෙඳ අනුපාතිකයේ ප්‍රභේද දක්වමින් ඒවායේ වෙනස්වීම්වලට හේතු හා ප්‍රතිවිපාක විශ්ලේෂණය කරයි.

- ✓ අපනයනය කරනු ලබන භාණ්ඩ ඒකකයකින් ලබා ගත හැකි ආනයන භාණ්ඩ ඒකක ප්‍රමාණය වෙළෙඳ අනුපාතය ලෙස හැඳින්වේ.

වෙළෙඳ අනුපාතිකයේ ප්‍රභේද දෙකකි.

1.භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය

2.ආදායම් වෙළෙඳ අනුපාතිකය

- ✓ භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය යනු අපනයන ඒකකයකින් ලබා ගත හැකි ආනයන භාණ්ඩ ඒකක ප්‍රමාණය ලෙස දැක් වූ වෙළෙඳ අනුපාතයමය.
- ✓ ආදායම් වෙළෙඳ අනුපාතය යනු අපනයන ආදායමෙහි ආනයන ක්‍රය ශක්තිය මැනීම සඳහා භාවිත කරන දර්ශකයයි.

1.භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය අඩු වීම කෙරෙහි බලපාන හේතු හා වැඩි වීම කෙරෙහි බලපාන හේතු 4 බැගින් ලියන්න.

2.භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය ඉහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක හා පහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක 4 බැගින් ලියන්න.

3. ආදායම් වෙළෙඳ අනුපාතිකය ඉහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක හා පහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක 4 බැගින් ලියන්න.